ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි
2017 දෙසැම්බර් 24

යොමු අංකය : 1718-014

දයාබර දෙමාපියන් වෙත,

**ළමා චිත්‍ර තරඟය 2018 - සහභාගී වීම**

ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ඩුබායි දහම් පාසල මගින් වාර්ෂිකව පවත්වනු ලබන ළමා චිත්‍ර තරඟය, 2018 ජනවාරි මස 06 වැනිදා, සෙනසුරාදා පැවැත්වීමට සියලු කටයුතු යොදා ඇති අතර තරඟයට අයදුම් පත් භාර ගැනීම අවසන්වී ඇත.

චිත්‍ර තරඟයට, ඔබගේ දරුවන් සඳහා අයදුම් පත් භාර දුන් නමුත් කිසියම් හේතුවක් නිසා තරඟයට සහභාගී වීමට නොහැකි නම් කරුණාකර 2018 ජනවාරි මස 4 වැනිදා, බ්‍රහස්පතිනදා දිනට පෙර අප වෙත email මගින් දන්වන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු. සහභාගී වන දරුවන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා දහම් පාසලේ ගුරු මණ්ඩලය ඉතා වෙහෙස මහන්සි වී කටයුතු කිරීමට සිදුවෙන අතර, එසේ පහසුකම් සලසා, නොදන්වා සහභාගී නොවීම සියලුදෙනාගේ කාලය අපතේ යාමක් බව සලකන්න. එනිසා ඔවුනට සාධාරණයක් කිරීම සඳහා කරුණාකර මෙම දැනුම් දීම කරන ලෙස නැවතත් ඉල්ලා සිටිමු.

තරඟයට අයදුම් පත් භාරදී, නොදන්වා තරඟයට සහභාගී නොවන දරුවන් හට ලබන වසරේ චිත්‍ර තරඟයට සහභාගී වීමට අවස්ථාවක් නොලැබෙන බවද කරුණාවෙන් දැනුම් දෙමු.

ස්තුතියි,

සංවිධායක මණ්ඩලය